# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2307/09 - 2022 නොවැම්බර් මස 21 වැනි සඳුදා - 2022.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ වූ නියමය**

1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ (4) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය හරීන් ප්‍රනාන්දු වන මම, මේ නියමය මගින්,

(අ) 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ජනතා වතු සංවර්ධන මණ්ඩලයට පවරා දී ඇත්තා වූ ද, මේ නියමයේ පළමුවන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇත්තාවූ ද, දෙල්තොට (ගල්ලන්තැන්න පහල සහ ඉහල බෙල්වුඩ්) යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන වතු ඉඩම හා සම්බන්ධ 1988 අගෝස්තු 05 වැනි දින අංක 517/20 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22 අ (1) වැනි වගන්තිය යටතේ කරන ලද නියමයේ මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති දෙල්තොට වත්ත ඉඩම, දෙල්තොට ගෘප් (ගල්ලන්තැන්න කොටස) නැමති ඉඩමේ බිම් ප්‍රමාණයට අදාළ වන්නා වූ කොටස, ඒ මණ්ඩලය වෙත පවරනු ලැබීම සඳහා වූ ප්‍රතිෂ්ඨාවට අදාළ නියම හෝ කොන්දේසි අනුව ක්‍රියාකර නොමැති වීම හේතුවෙන් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම මගින් ඒ නියමය සංශෝධනය කරමි; සහ

(ආ) මේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම මත මේ නියමයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉඩම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

පළමුවන උපලේඛනය

ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා ඇති දෙල්තොට (ගල්ලන්තැන්න පහල සහ ඉහල බෙල්වුඩ්) නම් ඉඩමේ විස්තර

| *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ අංකය සහ දිනය* | *වතු ඉඩමේ නම* | *පරිපාලන දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරන ලද ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් වලින්* |
|---|---|---|---|---|
| අංක 517/20<br>1988.08.05 | දෙල්තොට (ගල්ලන්තැන්න පහල සහ ඉහල බෙල්වුඩ්) | මහනුවර | දෙල්තොට | 414.50 |

1A - G 38124 — 09 (2022/11)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

දෙවන උපලේඛනය

| *විශේෂ අංකය* | *ඉඩමේ නම* | *පරිපාලන දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරෙන ලද ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර වලින්* |
|---|---|---|---|---|
| 11/PCE/KD/18 | දෙල්තොට වත්ත ඉඩම, දෙල්තොට වත්ත ගෘප් (ගල්ලන්තැන්න වත්ත) | මහනුවර | දෙල්තොට | මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩදෙල්තොට (976) ග්‍රාම නිලධාරි වසමේ උඩදෙල්තොට ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එස්. කේ. ලියනගේ මහතා විසින් 2022.06.25 දින මැන සකස් කර ඇති 0096 දරන පිඹුරේ කැබලි අංක 1, 2, සහ 3 යන කැබලි වලින් නිරූපිත හෙක්ටයාර් 6.0702 ක් වන පහත සඳහන් මායිම් තුළ පිහිටි දෙල්තොට වත්ත ඉඩම, දෙල්තොට ගෘප් (ගල්ලන්තැන්න කොටස) නැමති ඉඩමේ කැබලිවල මායිම් විස්තර,<br><br>**කැබලි අංක 1 හි හෙක්ටයාර් 2.0234 ක ප්‍රමාණය**<br><br>*උතුරට* : හි. පි. 44057 පිඹුරේ ඉතිරි කොටස සහ ගල්ලන්තැන්න ඔය ද,<br><br>*නැගෙනහිරට* : ගල්ලන්තැන්න ඔය, හි. පි. 44057 පිඹුරේ ඉතිරි කොටස සහ මෙම පිඹුරේ කැබලි අංක 2 ද,<br><br>*දකුණට* : මෙම පිඹුරේ කැබලි අංක 2 සහ ප්‍රවේශ මාර්ගය ද,<br><br>*බටහිරට* : ප්‍රවේශ මාර්ගය, හි. පි. 44057 පිඹුරේ ඉතිරි කොටස සහ ගල්ලන්තැන්න ඔය ද,<br><br>**කැබලි අංක 2 හි හෙක්ටයාර් 2.0234 ක ප්‍රමාණය**<br><br>*උතුරට* : මෙම පිඹුරේ කැබලි අංක 1 සහ හි පි. 44057 පිඹුරේ ඉතිරි කොටස ද,<br><br>*නැගෙනහිරට* : හි. පි. 44057 පිඹුරේ ඉතිරි කොටස සහ මෙම පිඹුරේ කැබලි අංක 3 ද,<br><br>*දකුණට* : මෙම පිඹුරේ කැබලි අංක 3 සහ ප්‍රවේශ මාර්ගය ද, |

දෙවන උපලේඛනය (සම්බන්ධිතයි)

| විශේෂ්‍ය අංකය | ඉඩමේ නම | පරිපාලන දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරෙන ලද ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර වලින් |
|---|---|---|---|---|
| | | | | *බටහිරට* : ප්‍රවේශ මාර්ගය හා මෙම පිඹුරේ කැබලි අංක 1 ද<br><br>**කැබලි අංක 3 හි හෙක්ටයාර 2.0234 ක ප්‍රමාණය**<br><br>*උතුරට* : මෙම පිඹුරේ කැබලි අංක 2 සහ හි.පි. 44057 පිඹුරේ ඉතිරි කොටස ද,<br><br>*නැගෙනහිරට* : හි. පි. 44057 පිඹුරේ ඉතිරි කොටස ද,<br><br>*දකුණට* : හි. පි. 44057 පිඹුරේ ඉතිරි කොටස සහ ප්‍රවේශ මාර්ගය ද,<br><br>*බටහිරට* : හි. පි. 44057 පිඹුරේ ඉතිරි කොටස ප්‍රවේශ මාර්ගය සහ මෙම පිඹුරේ කැබලි අංක 2. |

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 නොවැම්බර් මස 16 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර"
1200/6,
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

EOG 11 - 0245

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.